නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය
வீடமைப்பு மற்றும் சமுர்த்தி அமைச்சு
Ministry of Housing & Samurdhi

4 මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4வதுமாடிசெத்சிரிபாயபத்தரமுல்ல
4floor, Sethsiripaya, Battaramulla

# දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
# வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
# Department of Divineguma Development

මගේ අංකය / எனது இல / My No } DDD/HO/MF/05/ IN

ඔබේ අංකය / உமது இல / Your No }

දිනය / திகதி / Date } 2015/08/14

**දිවිනැගුම චක්‍රලේඛ දි/ප්‍ර/බැ/2015/02**

ප්‍රජාමූල බැංකු කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය පරිදි මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ

**දිවිනැගුම ප්‍රජාමූල බැංකු / ප්‍රජාමූල බැංකු සමිති කළමණාකරුවන් වෙත,**

**<u>දිවිනැගුම ප්‍රජාමූල බැංකු / ප්‍රජාමූල බැංකු සමිති සඳහා අතරැදි මුදල් රක්‍ෂණ වැඩසටහන හා දිවිනැගුම ප්‍රජාමූල බැංකු කාර්ය මණ්ඩලය සඳහා ශාරීරික අනතුරු රක්‍ෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.</u>**

**හැඳින්වීම : -**

සමෘද්ධි අධිකාරිය යටතේ සමෘද්ධි බැංකු සංගම් හා මහා සංගම් සඳහා ක්‍රියාත්මක වු අතරැදි මුදල් රක්‍ෂණ වැඩසටහන හා බැංකු කාර්ය මණ්ඩලය සඳහා ක්‍රියාත්මක වු ශාරීරික අනතුරු රක්‍ෂණ වැඩසටහන දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව තුළද ක්‍රියාත්මක කෙරේ.දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ දිවිනැගුම ප්‍රජාමූල බැංකු හා ප්‍රජාමූල බැංකු සමිති හරහා නව ණය වැඩසටහන් ආරම්භ කිරීම, දිවිනැගුම ප්‍රතිලාභීන් වෙතලබාදෙන සහනාධාරය දිවිනැගුම බැංකු හරහා මුදලින් ගෙවීම යන කරුණු මත දිවිනැගුම ප්‍රජාමූල බැංකු හා ප්‍රජාමූල බැංකු සමිති තුළ සංසරණය වන මුදල් පරිමාව ඉහළ ගොස් ඇත.මෙම තත්ත්වය සැලකිල්ලට ගෙන වර්තමාන ක්ෂුද්‍රමූල්‍ය පද්ධතියට අත්‍යාවශ්‍ය වන්නා වු රක්‍ෂණ කාර්යභාරය දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍රමූල්‍ය පද්ධතිය තුළද වඩාත් පුළුල්ව හා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට අපේක්‍ෂා කෙරේ.ඒ සඳහා වන මෙම නව චක්‍රලේඛනය නිකුත් කිරීමත් සමඟ පහත සඳහන් චක්‍රලේඛ අවලංගු වේ.

| අනු අංකය | විෂය | මෙහෙයුම් අංකය | නිකුත් කළ දිනය |
|---|---|---|---|
| 01 | සමෘද්ධි බැංකු සංගම් වල අතරැදි මුදල් සංරක්ෂණය කිරීම | මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක 03 | 1997.06.10 |
| 02 | සමෘද්ධි බැංකු සංගම් වල අතරැදි මුදල් සංරක්ෂණය කිරීම | මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක 03 ට පළමු වන එකතුව | 2001.02.16 |
| 03 | සමෘද්ධි බැංකු සංගම් වල අතරැදි මුදල් සංරක්ෂණය කිරීම | මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක 03 ට දෙවන එකතු ව | 2006.10.04 |
| 04 | සමෘද්ධි බැංකු සංගම් වල අතරැදි මුදල් සංරක්ෂණය කිරීම | මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක 03 ට තුන්වන එකතුව | 2009.06.08 |
| 05 | සමෘද්ධි බැංකු සංගම් වල අතරැදි මුදල් සංරක්ෂණය කිරීම | මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක 03 ට හතර වන එකතුව | 2010.04.01 |
| 06 | සමෘද්ධි බැංකු සංගම් වල අතරැදි මුදල් සංරක්ෂණය කිරීම | මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක03 ට පස්වන එකතුව | 2010.07.22 |
| 07 | සමෘද්ධි බැංකු සංගම් වල අතරැදි මුදල් සංරක්ෂණය කිරීම | මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක 03ට හයවන එකතුව | 2011.06.24 |
| 08 | මුදල් සොරකම්, මංකොල්ලකෑම් වලදී සමෘද්ධි බැංකු සංගම්හි සේවකයන්ට සිදු වන ශාරීරික අනතුරු රක්ෂණය. | මෙහෙයුම් උපදෙස් චක්‍රලේඛ ලිපි අංක 12 | 2004.09.15 |


| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / மேலதிகபணிப்பாளர் தலைமையதிபதி / Additional DirectorGeneral | අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர் (நிர்வாகம்) / Director (Administration) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|
| දුරකථන/தொலைபேசி/Telephone: | 011-2872202 | 011-2861994 | 011-2873799 | 011-2889046 |
| ෆැක්ස්/தொலைமடல்/ Fax: | 011-2889002 | | 011-2873996 | 011-2887722 |
| ඊ-මේල්/ மின்னஞ்சல்/ E-Mail: | dgdivineguma@gmail.com | anuradhakum@yahoo.com | hrddivineguma@gmail.com | |

| | | | |
|---|---|---|---|
| 09 | මුදල් සොරකම්, මංකොල්ලකෑම් වලදී සමෘද්ධි බැංකු සංගම්හි සේවකයන්ට සිදු වන ශාරීරික අනතුරු රක්ෂණය. | මෙහෙයුම් උපදෙස් චක්‍රලේඛ ලිපි අංක 12 ට පළමු වන එකතුව | 2009.06.03 |
| 10 | මුදල් සොරකම්, මංකොල්ලකෑම් වලදී සමෘද්ධි බැංකු සංගම්හි සේවකයන්ට සිදු වන ශාරීරික අනතුරු රක්ෂණය. | මෙහෙයුම් උපදෙස් චක්‍රලේඛ ලිපි අංක 12 ට දෙවන එකතුව | 2010.07.22 |

**1.1 දිවිනැගුමප්‍රජා මුලබැංකු හා ප්‍රජාමුල බැංකු සමිති සඳහා අතරෑදි මුදල්රක්‍ෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.**

1.1 .දිවිනැගුම ප්‍රජාමුල බැංකු හා දිවිනැගුම ප්‍රජාමුල බැංකු සමිති සඳහා ක්‍රියාත්මක කරන අතරෑදි මුදල් රක්‍ෂණ වැඩසටහන යටතේ දිවිනැගුම ප්‍රජාමුල බැංකු හා ප්‍රජා මූල බැංකු සමිති සතු මුදල් සොරා ගැනීමක්,පැහැර ගැනීමක් සිදු වූ විට ඒ සඳහා වන්දි ගෙවීම කරනු ලබයි.වන්දි ගෙවීමේදී පොලිස් වාර්තා, අභ්‍යන්තර විගණන විමර්ශන වාර්තා, ප්‍රාදේශිය ලේකම්ගේ පරීක්ෂණ වාර්තා සැලකිල්ලට ගනු ලැබේ.

1.2 .**දිවිනැගුම ප්‍රජාමුල බැංකුව**දෛනිකව සේප්පුවේ තැන්පත් කර ඇති මුදල, වාණිජ බැංකු වෙත රැගෙන යන සහ රැගෙන එන මුදල,මුදල් අයකැමි භාරයේ පවතින මුදලයන සියල්ලේ එකතුව අතරෑදි මුදල්රක්‍ෂණ සීමාව යන්නෙන් අදහස්වේ.**ප්‍රජා මූල බැංකු සමිතිය** දෛනිකව සේප්පුවේ තැන්පත් කර ඇති මුදල හා වාණිජ බැංකු වෙත රැගෙන යන හෝ රැගෙන එන මුදල්වල එකතුව අතරෑදි මුදල් රක්ෂණ සීමාව ලෙස හැඳින්වේ.

1.3 .දිවිනැගුම ප්‍රජාමුල බැංකු හා ප්‍රජා මූල බැංකු සමිති අතරෑදි මුදල් රක්ෂණ ආවරණය ලබා ගැනීම අනිවාර්යය වේ.

1.4 .අතරෑදි මුදල් සඳහා රක්‍ෂණ ආවරණය වසරක කාලයක් සඳහා එකවර ලබාගත යුතුය. වර්ෂයක කාලය යන්නෙන් සාමාන්‍ය ලිත් වර්ෂය අදහස් වේ. (ජනවාරි1 දින සිට දෙසැම්බර් 31 දක්වා)

**2. අතරෑදි මුදල් රක්ෂණ සීමාව**

2.1 මෙම චක්‍රලේඛය නිකුත් වූ දින සිට වලංගු වන පරිදි මෙතෙක් රු.ලක්ෂ 10ක උපරිම සීමාවේ පැවති අතරෑදි මුදල් රක්ෂණ සීමාව රු.ලක්ෂ 20 දක්වා වැඩි කෙරේ.මුදල් සීමාව හා ඒ සඳහා වසරකට එවිය යුතු රක්ෂණ වාරික මුදල් පිළිබඳ විස්තර ඇමුණුම 1හි සඳහන් කර ඇත.

2.2 අතරෑදි මුදල් රක්ෂණ සීමාව තීරණය කිරීමේදී ප්‍රජාමූල බැංකුව,ප්‍රජාමූල බැංකු සමිතිය තුළ සිදු කරන ගණුදෙනු ප්‍රමාණය පිළිබඳ අවධානය යොමු කළ යුතුය.මෙහිදී කළමණාකරු ගණුදෙනු ප්‍රමාණය පිළිබඳ සලකා බලා පාලක මණ්ඩලය/විධායක කමිටුව හා සාකච්ඡා කර රක්ෂණ සීමාව තීරණය කර ගත යුතුය.

2.3 මෙසේ මුදල් සීමාව වැඩි කර තිබුණද අනවශ්‍ය අයුරින් වැඩි මුදල් පරිමාවක් රඳවා ගැනීම නොකළ යුතුය.වැඩි ගණුදෙනු ප්‍රමාණයක් සිදු කෙරෙන ඉහළ ණය නිකුත් කිරීමක් පවතින බැංකු,ප්‍රජාමූල බැංකු සමිති පමණක් තම අවශ්‍යතාවය අනුව ඉහළ මුදල් සීමාවක් තබාගැනීම කළ යුතුය.

2.4 ඉහළ මුදල් සීමාවක් අනුමත කර තිබුණ ද අනවශ්‍ය අයුරින් විශාල මුදල් ප්‍රමාණයක් සේප්පුවේ තබාගෙන හෝ ප්‍රවාහනය කරමින් සිටින අතරතුර යම් සිදු වීමක් වුවහොත් වන්දි ගෙවීමේදී ඒ පිළිබඳ විශේෂ අවධානය යොමු කරනු ලැබේ. එහිදී අනවශ්‍ය ලෙස මුදල් රඳවාගෙන සිට බව සනාථ වුවහොත් අදාල නිලධාරීන්ට එරෙහිවවිනයානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ඇත.මෙම තත්ත්වය වැලැක්වීමට වැඩි ගණදෙනු සංඛ්‍යාවක් සිදු කරන අත්‍යාවශ්‍ය දින වල පමණක් අනුමත මුදල් සීමාව රඳවා ගැනීම සුදුසුවේ.

2.5 දිවිනැගුම බැංකු,ප්‍රජාමූල බැංකු සමිති අතරෑදි මුදල් සීමාවන් තීරණය කිරීම ,සේප්පුවේ මුදල්තැන්පත් කිරීම, වාණිජ බැංකු වෙත මුදල් ප්‍රවාහනය කිරීම යන කටයුතු වලදී නිකුත් කර ඇති උපදෙස් අනුව පමණක් කටයුතු කිරීමට බැංකු කළමණාකරු වගබලාගත යුතුය .උපදෙස් නොතකා කටයුතු කිරීම

හේතුවෙන් බැංකු සංගමය සතු මුදල් වල සුරක්ෂිතතාව බිඳවැටී මුදලට කිසියම් හානියක් සිදුවුවහොත් අතරැදි මුදල් රක්ෂණ වැඩසටහන යටතේ ඒ සඳහා වන්දි ගෙවීමට නොහැකි වේ.

2.6 උපදෙස් නොතකා කටයුතු කිරීම හේතුවෙන් ප්‍රජාමූල බැංකු , ප්‍රජාමූල බැංකු සමිති සතු මුදල් වලට හානියක් සිදු වුවහොත් බැංකු කළමණාකරු ඇතුළු කාර්යමණ්ඩලය තමා සතු පෞද්ගලික මුදලින් ඒ සඳහා වන්දි ගෙවීමට බැඳී සිටින බව අවධාරණය කරමු.

## 3. රක්ෂණවාරික මුදලගණනයකරනආකාරය

3.1 රු.15,000/- සිට රු.1,000,000/- දක්වා මුදල් සීමාවන්ටරක්ෂණ වාරික මුදලෙන් 5% ප්‍රමාණයක සහන මුදලක් හිමිවේ.රු.ලක්‍ෂ 11 සිට (රු.ලක්ෂ 11ද ඇතුළුව) රු.ලක්‍ෂ 20 දක්වා මුදල් සීමාවට එම සහනය හිමි නොවේ.

3.2 යම් බැංකුවක් බැංකු සමිතියක් පළමු වතාවට රු.15,000 - රු.1,000,000 අතර මුදල් සීමාවක් සඳහා (රු.1,000,000 ද ඇතුළුව) රක්ෂණය ලබා ගන්නේ නම් වාරිකයට නියමිත සම්පූර්ණ මුදලම එවිය යුතුය. ඊළඟ වසරේ එම මුදල් සීමාවටම රක්ෂණය ලබා ගන්නේ නම් මුදල් පැහැර ගැනීමක් වෙනුවෙන් රක්ෂණ වන්දි ලබාගෙන නොමැති නම් සම්පූර්ණ වාරික මුදලින් 5% ක ප්‍රමාණය අඩු කර ඉතිරි මුදල රක්ෂණ වාරිකය ලෙස එවිය යුතුය.එසේම රක්ෂණ වන්දියක් ලබාගතහොත් ඊට පසු වර්ෂයේ වාරික එවීමේදි නැවත මුළු මුදල ම එවිය යුතුවේ.

**5% සහනයගණනයකරීම සඳහා උදාහරණ :-**

2016 වසරේ රක්ෂණ ආවරණය පළමු වරට ලබාගන්නා ආයතනයක් 2016 වසරේ පළමු වරට රු ලක්ෂ 03 ක් සඳහා රක්ෂණ ආවරණය ලබාගන්නා විට එවිය යුතු වාරික මුදල = රු.9,000/- කි.

2016 වසරේ වන්දි ලබානොගෙන 2017 වසරේ රු.ලක්ෂ 03 සඳහා ම රක්ෂණ ආවරණය ලබාගන්නේ නම් වාරික ලෙස එවිය යුත්තේ රු.8,550/- ක මුදලකි.ගණනය කිරීම පහත පරිදිවේ.

$$\mathbf{9,000 \times \frac{5}{100} = 450.00}$$

**9,000 - 450 = 8,550.00**

ඉදිරියේදි මුදල් සීමාව වෙනස් නොවේ නම් මෙම මුදලම එවිය යුතුය.වන්දි ලබාගතහොත් ඊළඟ වසරේ රු.9,000/- ක මුදල එවිය යුතුය.

එම ආයතනයම 2018 වසරේ රු.ලක්ෂ 04 ක් සඳහා වාරිකය වැඩි කරන්නේ නම් එවිය යුතු සම්පූර්ණ වාරික මුදල රු.10,000/- කි.

2017 වසරේ රු.ලක්ෂ 03 ක් සඳහා රක්ෂණ ආවරණය ලබාගෙන තිබු බැවින් එම මුදලට හිමි වු 5% ක සහනය, එනම් රු.450 ක මුදල රු.10,000/- න් අඩු කල යුතුය.

**10,000 - 450 = 9,550.00**

රු.ලක්ෂ 03 සිට රු.ලක්ෂ 04 දක්වා වාරික මුදල වැඩි වු විට එවිය යුත්තේ රු.9,550/- ක මුදලකි.ඊළඟ වසරේ සිට රු.ලක්ෂ 04 ට නියමිත වාරික මුදලේ 5% ක ප්‍රමාණය අඩු කර වාරික එවිය යුතුය.

$$10{,}000 \times \frac{5}{100} = 500.00$$

**10,000 - 500 = 9,500.00**

වසර මුල මුදල් සීමාව වැඩි කරන විට මේ ආකාරයට ගණනය කිරීම කළ යුතුය.

රක්‍ෂණ මුදල් සීමාව වැඩි නොකරන්නේ නම් හැම විටම සමාන වාරික මුදලක් එවිය යුතුය.වන්දි ප්‍රතිලාභ නොගත්තද වර්ෂයෙන් වර්ෂය වාරික මුදලෙන් 5% බැගින් අඩු කිරීමක් සිදු නොවේ.

3.3 යම් හෙයකින් වසර මැද රක්‍ෂණ ආවරණ මුදල් සීමාව වැඩි කිරීමට අවශ්‍ය වුවහොත් වැඩිකිරීමට බලාපොරොත්තු වන මුදලේ වාරික මුදලින් ඒ වන විට වසර සඳහා එවා ඇති වාරික මුදල අඩුකල යුතුය.ලැබෙන පිළිතුර 12 න් බෙදා මුදල් සීමාව වැඩි කිරීමට අවශ්‍ය වන වසරේ ඉතිරි මාස ගණනින් වැඩි කර ලැබෙන අගය, වාරික මුදල වශයෙන් එවිය යුතුය.

උදා :- යම් වසරක ලක්‍ෂ 02 සඳහා වාරික මුදල ලෙස රු.7,125/- ක් එවා ඇත.

එම වසරේ අප්‍රේල් මස සිට මුදල් සීමාව රු.ලක්‍ෂ 04 දක්වා වැඩි කිරීමට අවශ්‍ය වන්නේ නම් එය පහත පරිදි ගණනය කෙරේ.

ලක්‍ෂ 04ටනියමිත වාරික මුදල රු.10,000/- කි.

එවා ඇති මුදල රු.7,125/- කි.

එවිය යුතු මුදල සඳහා රු.10,000 - 7125 = 2,875.00

එක් මාසයකට වන මුදල බැලිම සඳහා $\frac{2{,}875}{12} =$ 239.58

අප්‍රේල් සිට මුදල් සීමාව වැඩි කරන බැවින් අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා කාලය මාස 09 කි.(අප්‍රේල් මාසය ද ඇතුළත්ව)

එවිය යුතු මුදල සඳහා **239.58x 9 = 2,156.24**

ඒ අනුව රු. ලක්ෂ 2 සිට ලක්ෂ 4 දක්වා වසර මැදදී මුදල් සීමාව වැඩි කිරීමට අවශ්‍ය වුවහොත් එවිය යුතු ඉතිරි මුදල රු. 2,156.24 කි. වසර මැද මුදල් සීමාව වැඩි කිරීමට අවශ්‍ය වන්නේ නම් මේ ආකාරයට ගණනය කිරීම් කළ යුතුය.නැවත ඉදිරි වසරේ සිට (ජනවාරි 01 වැනිදා සිට) රක්ෂණ ආවරණ මුදලට නියමිත සම්පූර්ණ වාරික මුදල එවිය යුතුය.

## 4. දිවිනැගුම ප්‍රජාමූල බැංකු කාර්ය මණ්ඩලය සඳහා ශාරීරිකඅනතුරුරක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම

දිවිනැගුම ප්‍රජාමූල බැංකු සතු මුදල් සොරා ගැනීමක්, පැහැර ගැනීමක් සිදුවන විට හෝ ප්‍රජාමූල බැංකු සතු මුදල් වාණිජ බැංකු වෙත ගෙනයන, ගෙන එන අවස්ථා වල මුදල් පැහැර ගැනීමක් සිදුවුවහොත් එම අවස්ථාවේ නිලධාරීන්ට සිදුවන ශාරීරික අනතුරු වෙනුවෙන් වන්දි ගෙවීම සඳහා ශාරීරික අනතුරු රක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක වේ. දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිති සඳහා දැනට මෙම වැඩ සටහන ක්‍රියාත්මක නොවේ.

## 5. ශාරීරික අනතුරු රක්ෂණ වාරික මුදල

5.1 දිවිනැගුම ප්‍රජාමූල බැංකු ශාරීරික අනතුරු රක්ෂණය සඳහා වසරකට රු.1,000ක මුදලක් එකවර එවිය යුතුය.

5.2 අතුරුදි මුදල් සඳහා එවනු ලබන වාරික මුදලට මෙම මුදලද එකතු කර එම වටිනාකමට චෙක්පත ලිවිය යුතුය.

## 6. චෙක්පත් එවීම.

6.1 අතුරුදි මුදල් හා ශාරීරික අනතුරු රක්ෂණය වෙනුවෙන් එක් චෙක්පතක්, කළමණාකරු,ලංකා බැංකුව,බත්තරමුල්ල,දිවිනැගුම ප්‍රජාමූල බැංකු අතුරුදි මුදල් රක්ෂණ අරමුදල,ගිණුම් අංක 2937825 ලෙස ලියා ඇමුණුම 2 ආකෘතිය සම්පූර්ණ කර ලියාපදිංචි තැපෑලෙන් අධ්‍යක්ෂ ක්ෂුද්‍රමූල්‍ය,ක්ෂුද්‍රමූල්‍ය බැංකු අංශය,දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව, 4වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල යන ලිපිනයට එවිය යුතුවේ.

6.2 ඉදිරි වර්ෂයේ රක්ෂණාවරනය ලබා ගැනීමට පවත්නා වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර චෙක්පත ක්ෂුද්‍ර මූල්‍ය අංශය වෙත යොමු කළ යුතුය.

6.3 දෙසැම්බර් 31 දිනට චෙක්පත් ලියා යොමු කිරීමේ දී චෙක්පත් ලැබී ගිණුම්ගත වන අතරතුර හා චෙක්පත් අගරුවීමක් සිදුවුවහොත් ඉදිරි වසරේ දින ගණනාවකට රක්ෂණ ආවරණය නොලැබේ. එවිට එම කාලය ඇතුළත යම් සිදුවීමක් වුවහොත් වන්දි ගෙවීමට නොහැකිවනු ඇත. මෙම තත්ත්වය පිළිබඳ අවධානය යොමු කර දෙසැම්බර් මස පළමු සති දෙක තුළ චෙක්පත් එවීමට සැලකිලිමත් විය යුතුය.

## 7.දඩමුදල්අයකිරීම

7.1 දෙසැම්බර් 31 න්පසුක්ෂුද්‍රමූල්‍යඅංශයවෙතලැබෙනචෙක්පත්සඳහාචෙක්පතේ වටිනාකමින් 10% ක දඩ මුදලක් අයකිරීමට සිදු වේ.

7.2 ප්‍රජාමූල බැංකු හා ප්‍රජාමූල බැංකු සමිති දෙසැම්බර් 31 න් පසු ලියන චෙක්පත් සඳහා චෙක්පතේ වටිනාකමින් 10% ක මුදල ගණන් බලා එම වටිනාකම ද එකතු කර චෙක්පත ලිවිය යුතුය. මෙම දඩමුදල් බැංකු කාර්ය මණ්ඩලයේ පෞද්ගලික මුදලින් අයකිරීම කළ යුතුය.මේ සඳහා වන ගිණුම් සටහන් සියල්ල පහත දැක්වේ.

## 8. ගිණුම සටහන් තැබීම

**8.1** <u>අතුරුදි මුදල් හා ශාරීරික අනතුරු රක්ෂණය සඳහා චෙක්පත් එවීමේදි තැබිය යුතු ගිණුම් සටහන්</u>

| | | | |
|---|---|---|---|
| **2107 -** | වැය ගිණුම සොරකම්, මංකොල්ලකෑම් සඳහා රක්ෂණ ගාස්තු | - | හර |
| **2108 -** | වැය ගිණුම සංසරණය වන මුදල් සඳහා සඳහා රක්ෂණ ගාස්තු | - | හර |
| **3001 -** | ජංගම ගිණුම | - | බැර |

**8.2** <u>**10%** ප්‍රමාද ගාස්තු බැංකු කාර්ය මණ්ඩලයෙන් අය කරගන්නා විට ගිණුම් සටහන් තැබීම.</u>

8.2.1 <u>ප්‍රමාද ගාස්තු නිලධාරින්ගේ මුදලින් අය කරගැනීම</u>

| | | | |
|---|---|---|---|
| **3401 -** | අත ඉතිරි මුදල් ගිණුම | - | හර |
| **4048 -** | දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍රමූල්‍ය අංශයට යැවිය යුතු නිලධාරින්ගෙන් අය කරගත් ප්‍රමාද ගාස්තු ගිණුම | - | බැර |

8.2.2<u>ප්‍රමාද ගාස්තු නිලධාරින්ගේ තැන්පත් ගිණුමෙන් අය කරගැනිම</u>

| | | | |
|---|---|---|---|
| **4407 / 4403 -** | අදාල තැන්පත් ගිණුම (සාමාජික නොවන තැන්පතු / දිරියමාතා) | - | හර |
| **4048 -** | දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍රමූල්‍ය අංශයට යැවිය යුතු නිලධාරින්ගෙන් අය කරගත් ප්‍රමාද ගාස්තු ගිණුම | - | බැර |

**8.3** <u>ප්‍රමාද ගාස්තු සමඟ රක්ෂණ වාරික මුදල් ක්ෂුද්‍රමූල්‍ය අංශයට එවීම.</u>

| | | |
|---|---|---|
| **4048 -** දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍රමූල්‍ය අංශයට යැවිය යුතු නිලධාරින්ගෙන් අය කරගත් ප්‍රමාද ගාස්තු ගිණුම | - | හර |
| **2107 -** වැය ගිණුම සොරකම්, මංකොල්ලකෑම් සඳහා රක්ෂණ ගාස්තු | - | හර |
| **2108 -** වැය ගිණුම සංසරණය වන මුදල් සඳහා සඳහා රක්ෂණ ගාස්තු | - | හර |
| **3001 -** ජංගම ගිණුම | - | බැර |

**8.5** <u>මුදල් සොරා ගැනීමක්, මංකොල්ලකෑමක් සිදු වූ විට ගිණුම් තැබීම.</u>

| | | |
|---|---|---|
| **3310 -** අවිනිශ්චිත ගිණුම (ණයගැතියෝ) | - | හර |
| **3401 -** අත ඉතිරි මුදල් ගිණුම | - | බැර |

**8.6** <u>මුදල් සොරා ගැනිමක් වෙනුවෙන් වන්දි මුදල් ලද විට ගිණුම් තැබීම.</u>

| | | |
|---|---|---|
| **3001 -** ජංගම ගිණුම | - | හර |
| **4003 -** ගණුදෙනුකරුවන් තැන්පත් කළ චෙක්පත් ගිණුම | - | බැර |

<u>චෙක්පත ගිණුමට තැන්පත් කල පසු (උපලබ්ධි වීමෙන් පසු)</u>

| | | |
|---|---|---|
| **4003 -** ගණුදෙනුකරුවන් තැන්පත් කළ චෙක්පත් ගිණුම | - | හර |
| **3310 -** අවිනිශ්චිත ගිණුම (ණයගැතියෝ) | - | බැර |

**(10% ප්‍රමාද ගාස්තු නිලධාරින්ගෙන් අය කරගැනීම වෙනුවෙන් මෙහිදි වගකීම් ගිණුම යටතේ 4048 ගිණුම අළුතින් හඳුන්වා දී ඇත)**

**9. අතරැදි රක්ෂණය හා ශාරීරික අනතුරු රක්ෂණය සඳහා වන්දි ඉල්ලුම් කිරීම.**

**9.1 අතරැදි රක්ෂණය සඳහා වන්දි ඉල්ලුම් කිරීම.**

9.1.1 ප්‍රජාමූල බැංකු / ප්‍රජාමූල සමිති සතු මුදල් පැහැරගැනීමක් හෝ සොරා ගැනීමක් සිදු වූ වහාම ඒ පිළිබඳ පොලීසියට හා ප්‍රාදේශීය ලේකම් වෙත දැනුම් දිය යුතුය.ප්‍රාදේශීය ලේකම් විසින් කඩිනමින් මේ පිළිබඳව පරික්ෂණයක් ආරම්භ කළ යුතුය.

9.1.2 සිද්ධිය වූ වහාම දිවිනැගුම ප්‍රධාන කාර්යාලයේ ක්ෂුද්‍රමූල්‍ය අධ්‍යක්ෂ දුරකථනයෙන් දැනුවත් කිරීම ද අත්‍යවශ්‍ය වේ.

9.1.3 වන්දි ඉල්ලුම් කිරීමේ දී ඇමුණුම 3හි දැක්වෙන අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර පොලිස් වාර්තා ,ප්‍රාදේශීය ලේකම්ගේ මූලික පරීක්ෂණ වාර්තා සමඟ ඉතා ඉක්මණින් ක්ෂුද්‍රමූල්‍ය අංශයට යොමු කල යුතුය.අදාල ලියවිලි සමඟ වන්දි ඉල්ලුම් කිරීම දින 30 කට වඩා පමා කරන්නේ නම් සිදු වූ පාඩුව අදාල නිලධාරින්ට දරා ගැනීමට සිදුවනු ඇත.

**9.2 ශාරීරික අනතුරු සඳහා රක්ෂණ වන්දි ඉල්ලුම් කිරීම.**

9.2.1 දිවිනැගුම බැංකු සංගම් සතු මුදල් සොරකම්,මංකොල්ලකෑම්වලදී සිදු වන ශාරීරික අනතුරු රක්ෂණය සඳහා ද ඉහත9.1.1 / 9.1.2 අනුව කටයුතු කල යුතුය.

9.2.2 එසේම සිදු වී ඇති ශාරීරික අනතුරු/ හානිය සම්බන්ධයෙන් රජයේ වෛද්‍යවරයෙකු විසින් කරන නිර්දේශ හා පොලිසියට කරන ලද පැමිණිල්ලේ පිටපතක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුය.

9.2.3 මරණයකදී නම් ඉහත ලියකිවිලිවලට අමතරව මරණ සහතිකය,ඉල්ලුම්කරු වෙනුවෙන් වන්දි ලබා ගැනීම සඳහා මරණයට පත්වූ පුද්ගලයා සම්බන්ධයෙන් ඇති නීත්‍යානුකූල අයිතිය තහවුරු කෙරෙන ලියවිලි (විවාහ සහතිකය,උප්පැන්න සහතිකය,ප්‍රාදේශිය ලේකම් විසින් අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි සහතිකය ඉදිරිපත් කල යුතුය)

**10. ශාරීරික අනතුරු රක්ෂණ වන්දි ලබා ගැනීම සඳහා තිබිය යුතු සුදුසුකම්.**

**10.1** නියමිත පරිදි රක්ෂණ වාරික ගෙවා තිබීම. (අනතුර සිදුවන අවස්ථාව වන විට රක්ෂණ වාරිකය ගෙවා තිබිය යුතුය)

**10.2**දිවිනැගුමබැංකුසංගම්වලඅතරුදි මුදල් සඳහා ආරක්ෂක ක්‍රියාමාර්ග සියල්ල අනුගමනය කරතිබීම.

**10.3** දිවිනැගුම බැංකු සංගම්වල මුදල් සොරාගැනීමක් හෝ පැහැර ගැනීමක් හෝ එසේ කිරීමට තැත් කිරීමක් පිලිබඳ පොලීසියට පැමිණිලි කර තිබීම හා දිවිනැගුම ප්‍රධාන කාර්යාලයේ ක්ෂුද්‍රමුල්‍ය අංශය දැනුවත් කර තිබීම.

**10.4** එවැනි සිද්ධියකදී මුදල් වලට කිසියම් හානියක් සිදුවී නම් වන්දි ලබා ගැනීම සඳහා අතරුදි මුදල් රක්ෂණය මඟින් වන්දි ඉල්ලා තිබීම.

**11. අතරුදි හා ශාරීරික අනතුරු රක්ෂණය සඳහා වන්දි ගෙවීම.**

**11.1 අතරුදි රක්ෂණය සඳහා වන්දි ගෙවීම**

**11.1.1** අදාල පරීක්ෂණ වාර්තා සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත වන්දි ගෙවීම සිදු කරන අතර නැති වූ මුදල හෝ ඉන් කොටසක් හෝ සොයා ගනු ලැබුව හොත් සොයාගත් මුදල් ප්‍රමාණයට සමාන මුදලක් ක්ෂුද්‍රමූල්‍ය අංශයට නැවත ලබාදිය යුතුය.

**11.2 ශාරීරික අනතුරු රක්ෂණය සඳහා වන්දි ගෙවීම.**

**11.2.1**දිවිනැගුම ප්‍රජාමුල බැංකු පරිශ්‍රය තුළදී හෝ දිවිනැගුම බැංකු සංගම්වල සිට වාණිජ බැංකු වෙත මුදල් ගෙනයාමේදී හෝ වාණිජ බැංකුවලින් දිවිනැගුම බැංකුව වෙත මුදල් ගෙන ඒමේදී හෝ මුදල් සොරකම් මංකොල්ලකෑම්, එසේ කිරීමට තැත් කිරීම්වලදී සිදුවන ජීවිත හානි හෝ ශාරීරික අකර්මන්‍යතාවයට තුඩු දෙන ආපදා වෙනුවෙන් මෙම අරමුදල මඟින් දිවිනැගුම ප්‍රජාමුල බැංකු කාර්ය මණ්ඩලයට ප්‍රතිලාභ ගෙවනු ලැබේ.

**11.2.2**ක්ෂේත්‍රයේ මුදල් එකතු කරන සංවර්ධන නිලධාරින් මෙම රක්ෂණ ආවරණයට හිමිකම් නොලබයි. එසේ වුවද ක්ෂේත්‍රයේ සංවර්ධන නිලධාරියෙකු හෝ දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඕනෑම ස්ථිර සේවයෙකු රාජකාරි කටයුත්තක් සඳහා බැංකු පරිශ්‍රය තුළ රැඳී සිටියදි සිදුවන සොරකමකදි හෝ මංකොල්ලකෑමකදි, එසේ කිරිමට තැත් කිරීමකදි ශාරීරිකව යම් ආපදාවකට භාජනය වුවහොත් එම නිලධාරියාද මෙම රක්ෂණ ප්‍රතිලාභ සඳහා හිමිකම් ලබයි.

**11.3** මෙම රක්ෂණ ප්‍රතිලාභයට හිමිකම් ලැබීම සඳහා අතරුදි මුදල් රක්ෂණය යටතේ බැංකුවේ මුදල් සඳහා ආරක්ෂාව සම්බන්ධයෙන් අනුගමනය කලයුතු සියලු ම ක්‍රියාමාර්ග ගෙන තිබීමද අත්‍යවශ්‍ය වේ.

**11.4**ලබාගත හැකි උපරිම ප්‍රතිලාභ

**කළමණාකරු, ඊටඉහලනිලධාරින්, දිවිනැගම සංවර්ධන නිලධාරින් හා ලිපිකරු ශ්‍රේණි සඳහා ලබාගත හැකි උපරිම වන්දි මුදල රු.ලක්ෂ 03 කි.**

**11.5**සිද්ධිය වී මසක් ඇතුලත පහත සඳහන් ආපදාවන්ට භාජනය වන සේවකයන්ට/ මරණයකදි නම් නීත්‍යානනුකූල උරුමක්කරුවන්ට උපරිම ආවරණ මුදලෙන් නිශ්චිත ප්‍රතිශතයක් වන්දි වශයෙන් ගෙවනු ලබන අතර ආපදාවන්ගේ ආකාරය අනුව ගෙවනු ලබන ප්‍රතිශතය පහත සඳහන් පරිදිවේ.

**11.6**මරණය -රක්ෂිත මුදලින් 100%

**11.7**දෑසේ පෙනීම මුළුමනින්ම හා සඳහටම අහිමි වීම -රක්ෂිත මුදලින් 100%

**11.8**ශාරීරිකව වෙන් වීමෙන් දෑතම හෝ දෙපයම හෝ එක් අතක් සමග එක් පාදයක් හෝ මුළුමනින්ම අහිමි වීම -රක්ෂිත මුදලින් 100%

**11.9**එක් ඇසක පෙනීම මුළුමනින්ම සඳහටම නැතිවීම සමග ශාරීරිකව වෙන්වීමෙන් එක් අතක් හෝ එක් පාදයක් හෝ මුළුමනින්ම අහිමිවීම } රක්ෂිත මුදලින් 100%

**11.10**එක් ඇසක පෙනීම මුළුමනින්ම සඳහටම නැතිවීම -රක්ෂිත මුදලින්50%

**11.11**ශාරීරිකව වෙන්වීමෙන් එක් අතක් හෝ එක් පාදයක් මුළුමනින්ම අහිමි වීම -රක්ෂිත මුදලින් 50%

**11.12**සාමාන්‍ය රාජකාරී කටයුතු වල නිරත වීමට නොහැකි තාවකාලික (පූර්ණ අකර්මන්‍යතාවයන්) රජයේ වෛද්‍යවරයෙකුගේ නිර්දේශය මත සේවයෙකු නිවාඩු ගිය සම්පූර්ණ දින ගණන සඳහා උපරිම කාලය මාස 06 කට යටත්ව පහත සඳහන් පරිදි වන්දි ගෙවනු ඇත.

**11.12.1**දින 07 ක කාලයක් වෛද්‍ය නිවාඩු ලැබීම වෙනුවෙන් රක්ෂිත මුදලින් 0.5% පදනම මත නිවාඩු ලබාගත් දින ගණන සඳහා (එනම් දිනක් නිවාඩු ලැබීම වෙනුවෙන් රක්ෂිත මුදලින් 0.071% කි)

**11.13** සාමාන්‍ය රාජකාරී කටයුතු වල නිරත වීමට නොහැකි අර්ධ අකර්මන්‍යතාවයන් හෝ තාවකාලික අකර්මන්‍යතාවයන්, සේවයටවාර්තාකිරීමෙන් අනතුරුව සාමාන්‍ය රාජකාරී කටයුතු වල නිරත වීමට නොහැකි අර්ධ අකර්මන්‍යතාවයකදී රජයේ වෛද්‍යවරයෙකු විසින් සැහැල්ලු රාජකාරී කටයුතු නිර්දේශ කරන කාලය සඳහා සිද්ධිය වී උපරිම මාස 06 ක කාලයකට යටත්ව පහත සඳහන් පරිදි වන්දි ගෙවනු ඇත.

**11.13.1**දින 07 ක් සඳහා රක්ෂිත මුදලින් 0.2% පදනම මත සැහැල්ලු රාජකාරී වල නිරත වන කාලය සඳහා (එනම් දිනක් සඳහා රක්ෂිත මුදලින් 0.029% කි)

**11.14** සාමාන්‍ය රාජාකාරී කටයුතු වල හෝ වෙනත් රාජකාරී කටයුත්තක නිරත වීමට නොහැකි පූර්ණ සහ ස්ථිර අකර්මන්‍යතාවයන් රක්ෂිත මුදලින් 100%.

**12.** **පොදු කරුණු**

**12.1** වාණිජ බැංකු වෙත මුදල් රැගෙන යාමේදි හා රැගෙන එමේදි ඒ සඳහා බලය පවරා ඇති නිලධාරින් පමණක් යෙදවීමට කළමණාකරු වගබලා ගත යුතුය.ප්‍රවාහනය සම්බන්ධයෙන්ද ලබාදී ඇති උපදෙස් ඒ අයුරින් ම අනුගමනය කළ යුතුය.

**12.2** මෙම අතරැදි මුදල් හා ශාරීරික අනතුරු රක්ෂණ අරමුදල මුදල් සොරාගැනීමක් හා පැහැර ගැනීමක් සිදු වු විට දිවිනැගුම ප්‍රජාමුල බැංකුවට හා ප්‍රජාමුල බැංකු සමිතියට සිදු වන පාඩුව මග හරවාලීම සඳහා පිහිටුවා ඇත.

**12.3** දැනට මෙම අරමුදල දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍රමුල්‍යා අංශය මඟින් මෙහෙයවනු ලබයි.

**12.4** අතරැදි මුදල් හා ශාරීරික අනතුරු රක්ෂණ සම්බන්ධයෙන් කිසියම් ගැටළුවක් වේනම් 011-2889003 දුරකථන අංකයෙන් අධ්‍යක්ෂ ක්ෂුද්‍රමුල්‍යා ඇමතිමෙන් අවශ්‍ය තොරතුරු ලබාගත හැකිය.

**සුනන්දා පියසීලි**
**අධ්‍යක්ෂ (ක්‍ෂුද්‍රමූල්‍යා)**

**ධම්මික ගුණවර්ධන**
**අධ්‍යක්‍ෂ ජනරාල් (වැ.බ)**

පිටපත් :-

1. ලේකම්, නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය -කා.දැ.ස.
2. සියලුමදිස්ත්‍රික් ලේකම්වරුන් / දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල් -කා.දැ.ස.
3. දිවිනැගුම දිස්ත්‍රික් අධ්‍යක්ෂ -කා.දැ.ස
4. සියලුම ප්‍රාදේශිය ලේකම්වරුන් -කා.දැ.ස
5. සියලුම මුලස්ථාන කළමණාකරුවන් -කා.දැ.ස.
6. ප්‍රධානඅභ්‍යාන්තර විගණක, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව -කා.දැ.ස.
7. රජයේ විගණකාධිපති -කා.දැ.ස.

ඇමුණුම **01**

## අතරැදි මුදල් සීමාවට අදාල වාරික මුදල් පිළිබඳ විස්තර

| රක්ෂණ මුදල | මුදලට නියමිත වාරිකය | **5%** සහනය | සහනය අඩු කළ පසු මුදල |
|---|---|---|---|
| 15,000.00 | 1,500.00 | 75.00 | 1,425.00 |
| 20,000.00 | 1,800.00 | 90.00 | 1,710.00 |
| 25,000.00 | 2,100.00 | 105.00 | 1,995.00 |
| 30,000.00 | 2,400.00 | 120.00 | 2,280.00 |
| 35,000.00 | 2,700.00 | 135.00 | 2,565.00 |
| 40,000.00 | 3,000.00 | 150.00 | 2,850.00 |
| 45,000.00 | 3,300.00 | 165.00 | 3,135.00 |
| 50,000.00 | 3,600.00 | 180.00 | 3,420.00 |
| 55,000.00 | 3,900.00 | 195.00 | 3,705.00 |
| 60,000.00 | 4,200.00 | 210.00 | 3,990.00 |
| 65,000.00 | 4,500.00 | 225.00 | 4,275.00 |
| 70,000.00 | 4,650.00 | 232.50 | 4,417.50 |
| 75,000.00 | 4,800.00 | 240.00 | 4,560.00 |
| 80,000.00 | 5,100.00 | 255.00 | 4,845.00 |
| 85,000.00 | 5,400.00 | 270.00 | 5,130.00 |
| 90,000.00 | 5,700.00 | 285.00 | 5,415.00 |
| 95,000.00 | 5,850.00 | 292.50 | 5,557.50 |
| 100,000.00 | 6,000.00 | 300.00 | 5,700.00 |
| 125,000.00 | 6,600.00 | 330.00 | 6,270.00 |
| 150,000.00 | 6,900.00 | 345.00 | 6,555.00 |
| 175,000.00 | 7,200.00 | 360.00 | 6,840.00 |
| 200,000.00 | 7,500.00 | 375.00 | 7,125.00 |
| 225,000.00 | 7,800.00 | 390.00 | 7,410.00 |
| 250,000.00 | 8,100.00 | 405.00 | 7,695.00 |
| 275,000.00 | 8,400.00 | 420.00 | 7,980.00 |
| 300,000.00 | 9,000.00 | 450.00 | 8,550.00 |
| 350,000.00 | 9,500.00 | 475.00 | 9,025.00 |
| 400,000.00 | 10,000.00 | 500.00 | 9,500.00 |
| 450,000.00 | 11,000.00 | 550.00 | 10,450.00 |
| 500,000.00 | 12,000.00 | 600.00 | 11,400.00 |
| 550,000.00 | 13,000.00 | 650.00 | 12,350.00 |
| 600,000.00 | 14,000.00 | 700.00 | 13,300.00 |
| 650,000.00 | 15,000.00 | 750.00 | 14,250.00 |
| 700,000.00 | 16,000.00 | 800.00 | 15,200.00 |
| 750,000.00 | 17,000.00 | 850.00 | 16,150.00 |
| 800,000.00 | 18,000.00 | 900.00 | 17,100.00 |
| 900,000.00 | 20,000.00 | 1,000.00 | 19,000.00 |
| 1,000,000.00 | 22,000.00 | 1,100.00 | 20,900.00 |
| 1,100,000.00 | 24,500.00 | | 24,500.00 |
| 1,200,000.00 | 27,000.00 | | 27,000.00 |
| 1,300,000.00 | 29,500.00 | | 29,500.00 |
| 1,400,000.00 | 32,000.00 | | 32,000.00 |
| 1,500,000.00 | 34,500.00 | | 34,500.00 |
| 1,600,000.00 | 37,500.00 | | 37,500.00 |
| 1,700,000.00 | 40,500.00 | | 40,500.00 |
| 1,800,000.00 | 43,500.00 | | 43,500.00 |
| 1,900,000.00 | 46,500.00 | | 46,500.00 |
| 2,000,000.00 | 49,500.00 | | 49,500.00 |

දිවිනැගුම ප්‍රජාමූල බැංකුව / බැංකු සමිතිය :- ......................................

(තිත් ඉර මත බැංකුවේ / ප්‍රජාමූල බැංකු සමිතියේ නම ලියන්න)

ලිපිනය :- ......................................

දිනය :- 20..................................

දිවිනැගුම ප්‍රජාමූල බැංකු / බැංකු සමිති අතුරුදි මුදල් රක්ෂණ අංකය :- ..............................

දිවිනැගුම ප්‍රජාමූල බැංකු ශාරීරික අනතුරු රක්ෂණ අංකය :- ............................

(ප්‍රජාමූල බැංකු සඳහා පමණි)

අධ්‍යක්ෂ ක්ෂුද්‍රමූල්‍ය,

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව,

04 වන මහල,

සෙත්සිරිපාය, බත්තරමුල්ල.

**අතුරුදි මුදල් හා ශාරීරික අනතුරු රක්ෂණ වාරිකය එවීම**

20 ................. වසර සඳහා අතුරුදි හා ශාරීරික අනතුරු රක්ෂණ වාරික මුදල මේ සමඟ ඉදිරිපත් කරමි.

1. රක්ෂණ ආවරණ ලබාගන්නා මුදල් සීමාව රු. ...........................................
2. රක්ෂණ වාරික මුදල රු. ...........................................
3. 5% සහන මුදල රු. ...........................................
4. 5% සහනය අඩුකල පසු වාරික මුදල රු. ...........................................
5. ශාරීරික අනතුරු රක්ෂණ වාරිකය රු. ...........................................
6. 10% දඩ මුදල (අදාල නම්) රු. ...........................................

මුළුමුදල (4 + 5) / (4 + 5 + 6) රු. ...........................................

චෙක්පත් අංකය :- ...........................................

චෙක්පත් නිකුත් කල ලංකා /මහජන බැංකු ශාඛාව :- ...........................................

ඉල්ලුම් කර ඇති රක්ෂණ ආවරණ මුදල් සීමාව ඉක්මවා මුදල් සංසරණය නොකිරීමට වගබලා ගන්නා මෙන් මින් දන්වා සිටිමු.

| | |
|---|---|
| බැංකු ලිපිකරු, | කළමණාකරු, |
| නම:-........................................... | නම :-......................................... |
| අත්සන:-........................................... | අත්සන :-......................................... |
| දිනය:-........................................... | දිනය :-......................................... |
| | (නිලමුද්‍රාව) |

දිවිනැගුම ප්‍රජාමූල බැංකුවේ නම :-..................................................
දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිතියේ නම :-..................................................
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නම :-..................................................

අධ්‍යක්ෂ (ක්ෂුද්‍රමූල්‍ය),
දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව,
04 වන මහල,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

<u>අතුරුදී මුදල් රක්ෂණ අරමුදලින් වන්දි ඉල්ලුම් කිරීමේ අයදුම් පත්‍රය</u>

1. දිවිනැගුම ප්‍රජාමූල බැංකුව / බැංකු සමිතිය නම සහ ලිපිනය :-........................................
2. අතුරුදී මුදල් රක්ෂණ අංකය :-........................................
3. අවසන් වරට රක්ෂණ ආවරණය ලබාගත් මුදල් සීමාව රු. :-........................................
4. අවසන් වරට රක්ෂණ ආවරණය ලබාගත් වසර :-........................................
5. වන්දි ඉල්ලුම් කිරීමට අදාල සිදුවීම් සහ එය සිදු වූ දිනය :-........................................
6. සිදු වූ අලාභය රු:-........................................
7. ඉන් නැවත අය කරගත් ප්‍රමාණය රු:-........................................
8. වන්දි වශයෙන් ඉල්ලුම් කරන මුදල රු:-........................................
   (අකුරින් රුපියල් ........................................................................................................)
9. වන්දි ඉල්ලුම් කිරීමට අදාල සිදුවීම පිළිබඳ කෙටි විස්තරයක්:-........................................

**(පොලිස් වාර්තාවේ පිටපතක් අමුණන්න)**

ඉහත සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවත් සත්‍ය බවත් සහතික කරමි.මෙම අනතුර සිදුවුයේ දිවිනැගුම ප්‍රජාමූල බැංකු / බැංකු සමිති කාර්යය මණ්ඩලයේ නොසැලකිල්ල හේතුවෙනි. / නොසැලකිල්ල හේතුවෙන් නොවේ.

දිනය :- ............................................

අත්සන හා නම
දිවිනැගුම ප්‍රජා මූල බැංකු කළමණාකරු/
දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිති කළමණාකරු

**විධායක කමිටු / පාලක මණ්ඩල නිර්දේශය**

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත් සත්‍ය බවත් ප්‍රකාශ කරමු.රු.......................................... ක් (අකුරෙන් රුපියල් .............................................)වන්දි ලෙස ගෙවීම නිර්දේශ කරමු /නොකරමු. කාර්ය මණ්ඩලයේ නොසැලකිල්ලෙන් තොරව මෙය සිදු වී ඇත. / නොසැලකිල්ලෙන් මෙය සිදු වී ඇත.

| | |
|---|---|
| නම හා අත්සන<br>පාලක මණ්ඩල / විධායක කමිටු සභාපති | නම හා අත්සන<br>පාලක මණ්ඩල / විධායක කමිටු ලේකම් |
| දිනය :- .............................................. | දිනය :-.............................................. |

**දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිති කළමණාකරුගේ නිර්දේශය.**

අදාල කාල සීමාව සඳහා රක්ෂණ ආවරණ ලබාගෙන ඇත.කාර්ය මණ්ඩලයේ නොසැලකිල්ලෙන් තොරව / නොසැලකිල්ල හේතුවෙන් මෙම සිද්ධිය වී ඇත. වන්දි ගෙවීම් සුදුසු බව නිර්දේශ කරමි / නොකරමි.

..............................................

නම හා අත්සන
කළමණාකාරු, දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිතිය
දිනය

**(නිල මුද්‍රාව තබන්න)**

**(දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිති වන්දි ඉල්ලීම සඳහා අදාල නොවේ)**

**ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය**

වන්දි ඉල්ලුම් කිරීමට සිදු වු හේතුව පිළිබඳ කරුණු සොයා බැලු අතර ඉල්ලුම් කර ඇති වන්දි මුදල වන රු. .................................. (අකුරෙන් රුපියල්.......................................................... ) ගෙවීම සුදුසු බව නිර්දේශ කරමි.

...................................

නම හා අත්සන
ප්‍රාදේශීය ලේකම්

**(නිල මුද්‍රාව තබන්න)**

**(අදාල නොවන වචන කපා හරින්න)**

ඇමුණුම **04**

දිවිනැගුම ප්‍රජාමූල බැංකුවේ නම :-....................................................

දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිතියේ නම :-....................................................

ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නම :-....................................................

අධ්‍යක්ෂ (ක්ෂුද්‍රමූල්‍ය),
දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව,
04 වන මහල,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

**<u>මුදල් සොරකම්, මංකොල්ලකෑම් වලදී දිවිනැගුම ප්‍රජාමූල බැංකු සේවකයින් හට සිදුවන අනතුරු සඳහා වන්දි ඉල්ලුම් කිරීමේ අයදුම් පත්‍රය</u>**

1. දිවිනැගුම ප්‍රජාමූල බැංකුවේ නම සහ ලිපිනය :-....................................................
2. ශාරීරික අනතුරු රක්ෂණ අංකය. :-....................................................
3. අවසන් වරට රක්ෂණ ආවරණය ලබාගත් වසර:-....................................................
4. වන්දි ඉල්ලුම් කිරීමට අදාල සිදුවීම් සහ එය සිදු වූ දිනය:-....................................................
5. අනතුරේ ස්වාභාවය :-....................................................
6. අනතුරුට භාජනය වූ නිලධාරින් සම්බන්ධ තොරතුරු:-....................................................

| නම | තනතුර | හානියේ / අනතුරේ ස්භාවය |
|---|---|---|
| 1. | | |
| 2. | | |

7. මියගිය සේවකයකු වෙනුවෙන් වන්දි ඉල්ලුම් කරන විට, නිත්‍යානුකූල ඉල්ලුම්කරුගේ නම හා ඥාති සම්බන්ධතාවය දන්වන්න.
8. වන්දි වශයෙන් ඉල්ලුම් කරන මුදල රු. :- ....................................................
9. වන්දි ඉල්ලුම් කිරීමට අදාල සිදුවීම් පිළිබඳ කෙටි විස්තරයක් :-

**(පොලිස් වාර්තාවේ හා වෛද්‍ය වාර්තාවල පිටපතක් අමුණන්න)**

ඉහතින් සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවත් සත්‍ය බවත් සහතික කරමි.මෙම අනතුර සිදුවුයේ දිවිනැගුම ප්‍රජාමූල බැංකු කාර්ය මණ්ඩලයේ නොසැලකිල්ල හේතුවෙනි. / නොසැලකිල්ල හේතුවෙන් නොවේ.

දිනය : ............................

අත්සන හා නම
දිවිනැගුම ප්‍රජාමූල බැංකු කළමණාකරු

**පාලක මණ්ඩල නිර්දේශය**

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත් සත්‍ය බවත් ප්‍රකාශ කරමු.රු............................................. (අකුරෙන් රුපියල්........................................................) වන්දි ලෙස ගෙවීම සුදුසු බව නිර්දේශ කරමු /නොකරමු.කාර්ය මණ්ඩලයේ නොසැලකිල්ලෙන් තොරව මෙය සිදු වී ඇත. /නොසැලකිල්ලෙන් මෙය සිදු වී ඇත.

නම හා අත්සන
පාලක මණ්ඩල සභාපති

දිනය :- ............................

**දිවිනැගුම ප්‍රජාමුල බැංකු සමිති කළමණාකරුගේ නිර්දේශය.**

අදාල කාල සීමාව සඳහා රක්ෂණ ආවරණ ලබාගෙන ඇත.කාර්ය මණ්ඩලයේ නොසැලකිල්ලෙන් තොරව / නොසැලකිල්ල හේතුවෙන් මෙම සිද්ධිය වී ඇත. වන්දි ගෙවීම් සුදුසු බව නිර්දේශ කරමි / නොකරමි.

...............................................

නම හා අත්සන
කළමණාකාරු, දිවිනැගුම ප්‍රජාමුල බැංකු සමිතිය

දිනය

**(නිල මුද්‍රාව තබන්න)**

**ප්‍රාදේශිය ලේකම්ගේ නිර්දේශය**

වන්දි ඉල්ලුම් කිරීමට සිදු වු හේතුව පිළිබඳ කරුණු සොයා බැලු අතර ඉල්ලුම් කර ඇති වන්දි මුදල වන රු. .................................. (අකුරෙන් රුපියල්.......................................................... ) ගෙවීම සුදුසු බව මින් නිර්දේශ කරමි. / නොකරමි.

.......................................
නම හා අත්සන(ප්‍රාදේශීය ලේකම්)

**(නිල මුද්‍රාව තබන්න)**

**(අදාල නොවන වචන කපා හරින්න)**

ඇමුණුම 01

<u>අතරුදි මුදල් සීමාවට අදාල වාරික මුදල් පිළිබඳ විස්තර</u>

| සංරක්‍ෂණ මුදල | මුදලට නියමිත වාරිකය | 5% සහනය | සහනය අඩු කළ පසු මුදල |
|---:|---:|---:|---:|
| 15,000.00 | 1,500.00 | 75.00 | 1,425.00 |
| 20,000.00 | 1,800.00 | 90.00 | 1,710.00 |
| 25,000.00 | 2,100.00 | 105.00 | 1,995.00 |
| 30,000.00 | 2,400.00 | 120.00 | 2,280.00 |
| 35,000.00 | 2,700.00 | 135.00 | 2,565.00 |
| 40,000.00 | 3,000.00 | 150.00 | 2,850.00 |
| 45,000.00 | 3,300.00 | 165.00 | 3,135.00 |
| 50,000.00 | 3,600.00 | 180.00 | 3420.00 |
| 55,000.00 | 3,900.00 | 195.00 | 3,705.00 |
| 60,000.00 | 4,200.00 | 210.00 | 3,990.00 |
| 65,000.00 | 4,500.00 | 225.00 | 4,275.00 |
| 70,000.00 | 4,650.00 | 232.50 | 4,417.50 |
| 75,000.00 | 4,800.00 | 240.00 | 4,560.00 |
| 80,000.00 | 5,100.00 | 255.00 | 4,845.00 |
| 85,000.00 | 5,400.00 | 270.00 | 5,130.00 |
| 90,000.00 | 5,700.00 | 285.00 | 5,415.00 |
| 95,000.00 | 5,850.00 | 292.50 | 5,557.50 |
| 100,000.00 | 6,000.00 | 300.00 | 5,700.00 |
| 125,000.00 | 6,600.00 | 330.00 | 6,270.00 |
| 150,000.00 | 6,900.00 | 345.00 | 6,555.00 |
| 175,000.00 | 7,200.00 | 360.00 | 6,840.00 |
| 200,000.00 | 7,500.00 | 375.00 | 7,125.00 |
| 225,000.00 | 7,800.00 | 390.00 | 7,410.00 |
| 250,000.00 | 8,100.00 | 405.00 | 7,695.00 |
| 275,000.00 | 8,400.00 | 420.00 | 7,980.00 |
| 300,000.00 | 9,000.00 | 450.00 | 8,550.00 |
| 350,000.00 | 9,500.00 | 475.00 | 9,025.00 |
| 400,000.00 | 10,000.00 | 500.00 | 9,500.00 |
| 450,000.00 | 11,000.00 | 550.00 | 10,450.00 |
| 500,000.00 | 12,000.00 | - | 12,000.00 |
| 550,000.00 | 13,000.00 | - | 13,000.00 |
| 600,000.00 | 14,000.00 | - | 14,000.00 |
| 650,000.00 | 15,000.00 | - | 15,000.00 |
| 700,000.00 | 16,000.00 | - | 16,000.00 |
| 750,000.00 | 17,000.00 | - | 17,000.00 |
| 800,000.00 | 18,000.00 | - | 18,000.00 |
| 900,000.00 | 20,000.00 | - | 20,000.00 |
| 1,000,000.00 | 22,000.00 | - | 22,000.00 |
| 1,100,000.00 | 24,500.00 | - | 24,500.00 |
| 1,200,000.00 | 27,000.00 | - | 27,000.00 |
| 1,300,000.00 | 29,500.00 | - | 29,500.00 |
| 1,400,000.00 | 32,000.00 | - | 32,000.00 |
| 1,500,000.00 | 34,500.00 | - | 34,500.00 |
| 1,600,000.00 | 37,500.00 | - | 37,500.00 |
| 1,700,000.00 | 40,500.00 | - | 40,500.00 |
| 1,800,000.00 | 43,500.00 | - | 43,500.00 |
| 1,900,000.00 | 46,500.00 | - | 46,500.00 |
| 2,000,00.00 | 49,500.00 | - | 49,500.00 |